**මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය - 2021**

**------------------------------------------------------------------**

මහ කොළඹ අපජලය කළමනාකරණය ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහ නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 සහ අංක 2558 දරන ව්‍යාපෘති ගිවිසුම්වල 2.09 උපලේඛනය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------------**

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාගර හා මිරිදිය ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 1.5 ක නාගරික හා උප නාගරික වැසියන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ආ) වත්කම් කළමණාකරණය, මූල්‍ය කළමණාකරණය, මෙහෙයුම් කාර්යසාධනය නියාමනය, පාරසරික නියාමන අනුකූලතාවය, පාරිභෝගික සේවා සහ නිසි සනීපාරක්ෂක සේවා සැපයීමේදී ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම (ඇ) ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහාය යනාදි සංරචක යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,597.11කට සමාන එජඩො මිලියන 110.24ක් වන අතර ඉන් රු.මිලියන 10,783.63කට සමාන එජඩො මිලියන 94.37ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,813.46කට සමාන එජඩො මිලියන 15.87ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දින 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

**-------**

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **නීති,රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

| **නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | සමාලෝචන කමිටු මාස 02 කට වරක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, 2021 වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | සෞඛ්‍ය අංශ මගින් ක්‍රියාත්මක කරන ලද රෙගුලාසිවලට අනුගතවෙමින් රැස්වීමක් සංවිධානය කිරීම අසීරුවිය. | විකල්පයක් ලෙස මාර්ගගත රැස්වීම් පැවැත්වීම කළ යුතුව තිබුණි. |

**3.3** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| **සංරචකය** | **2021 දෙසැම්බර් 31 දිනට** | | | |
|---|---|---|---|---|
| | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය** | **අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය** | **විගණන ගැටලුව** | **ප්‍රමාදය සඳහා හේතු** |
| <u>ප්‍රධාන මලාපවහන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම</u><br>අපජල පොම්පාගාර සහ ප්‍රධාන පොම්පාගාර සැලසුම් කිරීම, ඉදිකිරීම සහ පුනරුත්ථාපනය කිරීම. | | | ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 09 දින ආරම්භකර 2015 ජුනි 30 දින නිම කිරීමට සැලසුම්කර 2021 දෙසැම්බර් 31 දින තෙක් 4 වතාවක් දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය මන්දගාමී විය. | ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතාවල ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන, පාරිසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් විය. එය ව්‍යාපෘතියේ පිරිවැය සහ අනවශ්‍ය බැඳීම් ගාස්තු ඉහළයාමට බලපානු ලැබේ. |

**පොම්පාගාර**

| | | |
|---|---|---|
| වනාතමුල්ල | 100 | 97 |
| මාලිගාවත්ත | 100 | 76 |
| බොරැල්ල | 100 | 64 |
| බම්බලපිටිය | 100 | 99 |
| විටිස්වයික් | 100 | 71 |
| තිබිරිගස්යාය | 100 | 74 |
| සීඑස් 3 | 100 | 99 |
| කොම්පඤ්ඤවීදිය | 100 | 98 |

**ප්‍රධාන පොම්පාගාර**

| | | |
|---|---|---|
| වනාතමුල්ල | 100 | 61 |
| විටිස්වයික් | 100 | 61 |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** නොවැළැක්විය හැකි හේතුන් සහ සම්මුතික බැඳීම් හේතුවෙන් කොන්ත්‍රාත්තුව දීර්ඝ කර ඇත. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය කොන්ත්‍රාත්තුවේ ප්‍රමාදයන් සඳහා ප්‍රධාන හේතුව විය.

**විගණකගේ නිර්දේශ** ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලු | | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | <u>තනි පුද්ගල උපදේශකවරු</u> | | |
| | උපදේශක දීමනා ගෙවීම සඳහා උපරිම දින 22ක් වැඩකළ යුතු බව දක්වා තිබුණි. කෙසේවෙතත්, ගෙවීම් වවුචර්පත් පරීක්ෂාවේදී උපරිම දින 22 ක් නොපැමිණ උපදේශන දීමනාව ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා ගෙවීම් වවුචර්පත් පරීක්ෂාවේදී වැඩ නොකරන දින සඳහා එකතුව රු.මිලියන 3.9ක් ගෙවා තිබුණි. | සඳහන් කළ පරිදි ගෙවීමක් සිදුකර නොමැත. | උපදේශන දීමනාව නීති හා රෙගුලාසිවලට අනුකූලව ගෙවිය යුතුයි. |
| (ආ) | නිලධාරීන් තිදෙනෙකු බේරුම්කරණ කටයුතු සඳහා පත්කර තිබුණු අතර නිලධාරීන් තෝරාගත් ආකාරය සහ පත් කිරීම සඳහා ලබාගත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. නිලධාරීන් තිදෙනා වෙත 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 1.7ක් ගෙවා තිබුණි. | බේරුම්කරණ කටයුතු සහ නීතිපති දෙපාර්තමේන්තුවේ රාජ්‍ය උපදේශකයින්ට සහයවීම සඳහා විශේෂඥයින් තෝරා ගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා බලය ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත පවරා ඇත. | ගෙවීම් සිදුකිරීමට පෙර නිසි අනුමැතිය ලබා ගත යුතුය. |

## 3.3 ඌනඋපයෝජිත සම්පත්

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මහා භාණ්ඩාගාරය 2010 පෙබරවාරි 15 දින සිට 2021 අගෝස්තු 15 දක්වා OCR ණය මුදලේ ලබා නොගත් ණය ශේෂය මත රු. 122ක් බැදීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි. | ණය කාලසීමාව ඉක්මවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී බැදීම් ගාස්තුවේ යම් අමතර පිරිවැයක් ඇත. | නිසි ව්‍යාපෘති සැලසුම්කරණයක් මගින් මෙම පිරිවැය අවම කරගත යුතුය. |
| (ආ) | ජලාපවහන අංශයට හඳුන්වා දෙන ලද රු. මිලියන 3.2ක් වටිනා මූල්‍ය කළමනාකරණ සහ ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට නිශ්කාර්ය පැවතුණි. | කොළඹ මහ නගර සභාව විසින් නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට පියවර ගෙන ඇත. | විදේශ ආයෝජන කාර්යක්ෂමව භාවිත කිරීමට පියවර ගතයුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගැටලු

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2021 වර්ෂයේ ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ නිලධාරීන් 7 දෙනකු සඳහා රු. මිලියන 2.5ක් ගෙවා තිබුණු අතර රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය නිමකර ආසන්නව මාස 70 ක් ගතවී තිබුණද ප්‍රතිපත්ති සහයක කණ්ඩායම සඳහා රු.මිලියන 41.2ක මුදලක් ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි. ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති සඳහා ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ දායකත්වය ඇගයීමට නොහැකිවිය. | ව්‍යාපෘතියේ අනුමත කාර්යමණ්ඩලයේ පත්කිරීම මත ප්‍රතිපත්ති සහයක කණ්ඩායම වෙත ගෙවීම් සිදුකර ඇත. | කණ්ඩායම ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකාරීව දායක විය යුතු අතර ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම සිදු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරය සම්බන්ධ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වයට සෘජු බලපෑමක් ඇති තනතුරු 11ක පුරප්පාඩු 16ක් තිබුණද පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | තාක්ෂණික ශ්‍රේණිවල අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තෝරා ගැනීම අවසන් කර ඇත. | සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයකින් පුරප්පාඩු 16 පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |